**කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.**
**කොළඹ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
-------------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 18 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ප්‍රවර්ථන වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු, ගම් බූට්ස් 04 ක වටිනාකම රු.8,400 ක් වුවත් එය රු.84,000 ක් ලෙස රු.75,600 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් තැබීමේදී නිරවද්‍යතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුවේ. | පිළිගනිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) අඹතලේ වැව බෝට්ටු අංගනය බදු දීම වෙනුවෙන් 2018 වර්ෂයට ලැබිය යුතු රු.120,000ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු ගනුදෙනු ගිණුම් තැබිය යුතුවේ. | පිළිගනිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) 2012 වර්ෂයේ නිලධාරියකුට ගෙවන ලද රු.212,210ක විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදලක් තැන්පත් ගිණුමෙන් ඉවත්කර නොතිබූ අතර නිලධාරියෙකුගේ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකරන ලද රු.38,671 ක් තැන්පත් ගිණුමට බැරකර තිබුණි. | සියළු ලැබීම්, ආදායම් ගිණුම් ගත කළයුතුවේ. | ආපසු ගෙවීම තැන්පත් ලේඛණයේ සටහන් නොවුවද 2012/08/30 දින රු 212,210ක මුදල් ආපසු ගෙවා ඇති බව මුදල් පොත අනුව තහවුරුවේ. වැටුප් රහිත නිවාඩු සඳහා අයකරන ලද රු.38,672 ක මුදල ආදායමට ගෙන නොමැත. එය 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (iv) සමාලෝචිත වර්ෂයට අදාල රු.409,542ක් වූ විගණන ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි. | සියළු වියදම් හා ගෙවිය යුතු ගාස්තු ගිණුම් ගත කළයුතුවේ. | පිළිගතිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව වන්දි ඉල්ලා පවරා ඇති නඩු 04කින් නඩු 02ක් සඳහා වන්දියේ වටිනාකම නිශ්චයකර නොතිබුණු අතර නඩු 02ක් සම්බන්ධයෙන් රු.911,742 ක වන්දියක් නිශ්චයකර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුවේ. | පිළිගතිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපලේඛන අනුව ශේෂ අතර රු.57,856,134ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරිදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛණය සඳහා ලබා දී ඇති ආරම්භක ශේෂයන්හි වටිනාකම වෙනස්වීම මත මෙම වෙනස සිදු වී ඇත. සොයා බලා උපලේඛණය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන හා හිමිකම් ඔප්පු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.48,550,691ක් වු ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | 2015 වසරේ සිට නිවැරදිව මොටර් රථ කරත්ත ගිණුම හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම පවත්වාගෙන යන අතර ලියාපදිංචි කරන ලද ඉඩම් ඔප්පු ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|---|
| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරන තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | | |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i)මු.රෙ 571 | 1,219,389 | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගතිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii)මු.රෙ 756 | 60,236,594 | පොදු ගබඩා හා විදුලි ගබඩාවල අවසන් තොග ශේෂ, භෞතික තොග සමීක්ෂණ අගය හා සැසඳීම් කර ගිණුම්වලට ගලපා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගතිමි. 2019 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) චක්‍රලේඛ | | | | |
| (i) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 3,257,800 | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා ලබාදිය හැකි අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 9 කදී රු.131,250 සිට රු.1,000,000 දක්වා වූ පරාසයක නිකුත් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අතුරු අග්‍රිම නිකුත් කිරිමේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ 3/2015 අනුව කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන චක්‍රලේඛය - | කඩකුලී තක්සේරුව වසර 3කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නව කඩකුලී තක්සේරුව ඉල්ලා 2018.10.22 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ක්ෂේත්‍ර පරීක්ෂණය අවසන්කර ඇති බවත් ඉදිරි මස ඇතුලත වාර්තාව ලබාදිය හැකිබව දැනුම් දී ඇත. |
| (iii) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති 18 (I) - | පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා කසළ බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නිවාස සහ ව්‍යාපාරික ස්ථාන වලින් කසල බදු අයකීරීමේ ක්‍රමවේදයක් සකස් කර විමර්ශන නිලධාරියෙකු ඒ වෙනුවෙන් යොමුකර වගකීම පවරා ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.96,343,250 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.99,183,339 ක් විය.

2.2 මූල්‍ය පාලනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) කොලොන්නාව මහජන බැංකුවේ අංක 098-1-001-8-3913966 දරන ජංගම ගිණුම 2018 අගෝස්තු 31 වන දින සිට අක්‍රිය කර එදිනට ගිණුමේ පැවති මුදල එම බැංකුවෙහි පැවති අංක 965 දරන ගිණුමට මාරුකර තිබුණි. නමුත් බැංකුවේ තැන්පත් කලත් උපලබ්ධි නොවූ රු.1,098,123 ක චෙක්පත් සම්බන්ධයෙන් සොයාබලා කටයුතුකර නොතිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳව සොයා බලා කටයුතු කල යුතුවේ. | රු1,098,123 ක චෙක්පත් පෙර සිට ගිණුම්ගත වෙමින් පැමිණ ඇති මුදලක් වන අතර එය නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ආ) කොලොන්නාව මහජන බැංකුවේ අංක 098-1-001-8-3913965 දරන ජංගම ගිනුමේ 2018 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් විස්තරය අනුව දිනය හා චෙක්පත් අංකය සඳහන් නොවූ රු.28,197 ක චෙක්පතක් නිශ්කාශනය වී නොතිබුණු අතර 2012 සැප්තැම්බර් 11 දින තැන්පත් කළ රු.2,687 ක චෙක්පතක් උපලබ්ධි වී නොතිබුණි. | අදාල චෙක්පත් පිළිබඳ පරීක්ෂාකර බලා නිවැරදි කර ගත යුතුවේ. | රු 28,197ක චෙක්පත නිශ්චිතවම මෙතෙක් සොයාගත නොහැකිව ඇති අතර එය නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතී. 2012/09/11 තැන්පත් කළත් උපලබ්ධි නොවූ රු.2,687ක චෙක්පතද නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතී. |

## 2.3 ආදායම් පරිපාලනය

-------------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කිරීම් | රැස්කළ ආදායම | 2018 දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කිරීම් | රැස්කළ ආදායම | 2017දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (1) වරිපනම් හා බදු | 53,472,000 | 46,574,845 | 49,928,698 | 43,971,690 | 54,202,384 | 48,439,066 | 57,976,651 | 60,692,872 |
| (ii) කුලී | 11,643,000 | 3,154,200 | 606,306 | 3,524,300 | 3,992,508 | 3,489,440 | 5,497,628 | 2,452,609 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,072,500 | 697,230 | 697,230 | - | - | 566,110 | 566,110 | - |
| (iv)වෙනත් ආදායම් | - | 97,405,778 | 97,405,778 | - | - | 77,306,864 | 77,306,864 | - |
| එකතුව | 66,187,500 | 147,832,053 | 148,638,012 | 47,495,990 | 58,194,892 | 129,801,480 | 141,347,253 | 63,145,481 |

### 2.3.2 වරිපනම්

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් ශේෂය රු.40,888,466 කින් වර්ෂය තුලදී රු.18,169,836ක් හෙවත් 44% ක්ද ප්‍රවර්ථන වර්ෂයට අදාල වරිපනම් බදුවලින් වර්ෂය තුලදී රු.30,218,642 ක් හෙවත් සියයට 62 ක්ද අයකරගෙන තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කල යුතුවේ. | 2019.04.30 දිනවන විට 2018.12.31 දිනට හිඟ මුදලින් රු.9,459,969ක් එනම් 24% ප්‍රමාණයක් හා ප්‍රවර්තන රු.23,271,314ක් එනම් 52%ක ප්‍රමාණයක් අයකර ගෙන ඇත |
| (ආ) රු.50,000 කට වැඩියෙන් හිඟහිටි වරිපනම් ගිණුම් 05කින් අයවිය යුතු මුළු හිඟ මුදල රු.621,308 ක් විය. එම හිඟ මුදල් අයකර ගැනීමට හෝ දේපළ තහනම් කිරීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු සියළු හිඟ මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | • වරිපනම් අංක 185 - හිඟ මුදල අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.<br>• වරිපනම් අංක 35 - දරන දේපළ සභාව සතු දේපළක් බැවින් බිල් කිරිම නවතා හිඟ මුදල් කපා හැරීමට මහා සභා තීරණයක් ලබාගෙන ඇත.<br><br>• වරිපනම් අංක 18 – ගෙවා අවසන් කර ඇත. |

• වරිපනම් අංක 134/32 හා වරිපනම් අංක 01 - හිඟ වරිපනම් අයකර ගැනිමට රතු නිවේදන ලබා දි ඇත.

•මේ වන විට බල ප්‍රදේශය ආවරණය වන පරිදි ජංගම සේවා හා දේපළ තහනම් කටයුතු ආරම්භ කර ඇත.

2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අංගොඩ හන්දියේ උඩුමහල් නිවාස මසකට රු.450 ක කුලී පදනම මත කුලී කරුවන් වෙත ලබා දී තිබූ අතර, එහි නිවාස 03කින් කුලී මුදල් රු.63,000ක් හිඟව තිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. | 2019.05.03 අවසන් නිවේදන ද නිකුත් කර ඇත. තවදුරටත් හිඟ ගෙවීම පැහැර හැරියහොත් අදාළ නීතිමය කටයුතු සිදුකිරීමට කටයුතු කරමි. |

2.3.4 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| පසුගිය වසර 04 ක සිට සභාව කිසිදු උසාවි දඩ ආදායමක් අයකර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.24,000,000 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු සියළු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | උසාවි දඩ ආදායම ලෙස රු 24,000,000 ක් ලැබීමට නියමිතව තිබුණ ද මහේස්ත්‍රාත් අධිකරණය විසින් තවමත් එය පරීක්ෂා කර බලා අප වෙත එවා නොමැත. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා ආඥා පනතේ (3) වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන 2017 යටතේ, ඇස්තමේන්තු වටිනාකම රු.1,499,259ක් වූ කර්මාන්ත 02 ක් මහජන විරෝධතා හේතුවෙන් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි. | ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදි සියළු තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කර ප්‍රජා ආකල්ප පිළිබදව ද සොයාබලා ක්‍රියාත්මක කල යුතුවේ. | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යාමේදී මාර්ගයේ මුල් කොටසේ පදිංචිකරුවන් අදාළ ස්ථානයට යාමට නොහැකි වනසේ විරෝධතාවය දැක්වීම නිසා ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කොට ව්‍යාපෘතිය අවලංගු කරන ලදී. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 6 වන පරිච්ඡේදයේ 59 වැනි ඡේදය පරිදි කසල කළමනාකරණය විධිමත් කිරීම සඳහා සභාව විසින් දැනට පවත්වා ගෙනයන කොම්පොස්ට් අංගනය පුළුල් කිරීමට ඉඩකඩ නොමැති වීමට පිලියමක් ලෙස බලප්‍රදේශයේ සමස්ථ දිරන කසළ කොම්පෝස්ට්කරණය සමඟ කසළ උපයෝගී කරගෙන ජීව වායු නිපදවීම හා/හෝ වෙනත් තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි. | බලප්‍රදෙශයේ කසළ ගැටලුවට විසඳුමක් ලෙස කොම්පෝස්ට්කරණය වඩාත් ඵලදායි ලෙස යොදා ගත යුතුවේ. | කොම්පෝස්ට් අංගනයේ දැනට තිබෙන කසළ ටොන් 5ක ප්‍රමාණය පමණක් කොම්පෝස්ට්කරණය සඳහා යොදවා ගන්නා අතර එය පුළුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සභාව සතුව නොමැති වීම ගැටළුවක් වී ඇත. දිරන කසළ උපයෝගී කරගෙන පෞද්ගලික අංශයේ සහයද ලබාගෙන ජීව වායු නිපදවීමේ හැකියාව පිළිබඳ මේ දිනවල කරුණු සොයාබැලීම් සිදුකරන බැවින් ඉදිරියේදී ඒ සම්බන්ධවත් විධිමත් ක්‍රමවේදයන් සැළසුම් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව ක්‍රියාකිරිමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් මත පස් අවුරුදු සැලැස්මක් තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් කර සකස් කර ඇති අතර 2019 වසර සඳහා එක් එක් ඉලක්කයන් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුලත් කර ප්‍රතිපාදන වෙන්කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තථ්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 26ක් පැවතුණි. | සේවක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) ප්‍රාදේශීය සභාව විසින් සේවකයින් 07 දෙනෙකු වෙත ලබාදී තිබුණු ණය මුදල් වලින් ප්‍රවර්ථන වර්ෂයේදී කිසිදු වාරිකයක්/මුදලක් අය වී නොමැති ණය ශේෂය රු.269,892 ක් විය. | ණය මුදල් ආපසු අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුවේ. | සේවකයින් 6 දෙනෙකුට අදාල ණය අයකර ගැනීමට කටයුතු කර ඇති අතර එක් සේවකයෙකුට අදාල නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව සතු අඹතලේ වැව බෝට්ටු අංගනය<br>ප්‍රාදේශීය සභාවට අයත් මුල්ලේරියාව අඹතලේ වැව බෝට්ටු අංගනය ඇතුලත් ජැටිය හා ඊට අදාල ගොඩනැගිල්ල, භූමිය හා උද්‍යානය තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මසකට රු.10,000ක බදු මුදලකට බදු දී තිබුණි.<br>(i) මෙම දේපළ සභාවට අයත් දේපළක් ලෙස සළකා වර්ෂ 03 ක කාලයක් සඳහා බදු දී තිබුණද සභාවට අයත් බවට හිමිකම් ඔප්පු, පැවරුම් ලේඛණ, විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.<br>(ii) මෙම දේපළ මුල් අයිතිකරුවන්ගෙන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>(iii) උක්ත බදුකරු බදු ගෙවීම පැහැර හැර තිබූ අතර ප්‍රවර්ථන වර්ෂයට අදාලව හිඟ බදු කුලී හා දඩ ගාස්තු ලෙස රු.164,000 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් සම්බන්ධව නෛතික හිමිකම ලබාගත යුතු අතර සභාවට අයවිය යුතු සියළු ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | මෙම දේපල නාගරික සංවර්ධන අධිකාරියේ පැවරුම් ලිපියක් මත පවරා දී ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති නමුත් ඒ පිළිබඳව ලිඛිත සාක්ෂි සොයා ගැනිමට නොහැකි බැවින්, ඒ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා ඇත. ලිපි ලද පසු විගණනයට ඉදිරිපත් කරමි.<br>හිඟ බදු මුදල් ගෙවන ලෙස දන්වා ඇති අතර ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් නොගෙවීම මත බදුකරුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනිමි. |
| (ආ) අංගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ 05ක අනවසර පුද්ගලයන් පදිංචි වී සිටින බව 2019 මාර්තු 19 වන දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඉහත කඩවලින් අනවසර පුද්ගලයින් ඉවත්කර ඒවා අළුත්වැඩියා කර ටෙන්ඩර්කර බදුදීම තුලින් ආදායම් උත්පාදනය කිරීමට ඉහල කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | සභාවේ වත්කම් නිසි පරිදි ආරක්ෂා කර ආදායම් උත්පාදනයට කටයුතු කල යුතුවේ. | මේ වන විට අනවසර පුද්ගලයන් ඉවත් කර කඩ අලුත්වැඩියා කර කුලි පදනම මත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කරමින් පවතී. |

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඊ) පරිදි කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මකකල යුතුවේ. | 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන 09ක් සිදු කර ඇත. ඒ අනුව අදාල අංශ දැනුවත් කර ඇත. |